**<u>පුරප්පාඩු</u>**
**<u>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව</u>**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කළමනාකරණ සහකාර තනතුරේ පවතින පුරප්පාඩු වෙනුවෙන් ස්ථිර පදනමින් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

**1.** **<u>කළමණාකාර සහයක - තාක්ෂණික නොවන</u>**
**සුදුසුකම් (පොදු)**
**<u>බාහිර අයැදුම්කරුවන්</u>**

අධ්‍යාපන:

අ) i. සිංහල/දමිළ
ii. ඉංග්‍රීසි
iii. ගණිතය

ඇතුළුව අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ එක්වර විෂයන් හයක් සඳහා සම්මාන ලබා තිබීම

සහ
ආ) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) (සාමාන්‍ය දැනුම හැර) විෂයන් 3ක් සමත් වී තිබීම.

**<u>අභ්‍යන්තර අයැදුම්කරුවන්</u>**
පහත සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික මට්ටමේ - පුහුණු සහ ප්‍රාථමික මට්ටමේ - නුපුහුණු කාණ්ඩවල සේවකයින්ට අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

අධ්‍යාපන:

අ) i. සිංහල/දමිළ
ii. ඉංග්‍රීසි
iii. ගණිතය

ඇතුළුව අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ එක්වර විෂයන් හයක් සඳහා සම්මාන ලබා තිබීම

**වෙනත්:**

ඉහත සේවක කාණ්ඩය යටතේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ද සුදුසුකම් ලෙස සලකා බලනු ලැබේ.

**වැටුප් පරිමාණය-** MA 1-1-2025 (රු.46,220-10x 540-7x630-4x890-20x1190-83,390)
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025) සහ වෙනත් යෝජිත දීමනා

**වයස** - වයස අවු: 18ත් 45ත් අතර විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහත වයස් සීමාව අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමය :-** සම්මුඛ පරීක්ෂණයක් මගින්

- අදාළ අතිරේක පළපුරුදු - ලකුණු 30
- අදාළ අතිරේක සුදුසුකම් - ලකුණු 30
- වෙනත් සුදුසුකම් - ලකුණු 15
- සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා - ලකුණු 25

සුදුසු අයවලුන් තෝරා ගැනීමේදී අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් ලකුණු සලකා ප්‍රමුඛතාවය සකස් කරනු ලැබේ.

**බඳවා ගැනීමේ කොන්දේසි**

1. සියලු අයැදුම්කරුවන් තනතුරේ රාජකාරී ඉටු කළ හැකි ශාරීරිකව හා මානසිකව යෝග්‍යතාව සහ විශිෂ්ට සදාචාරාත්මක චරිතයක් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
2. පත්වීම් ලාභීන්ට සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල හිමි වේ.
3. දැනට රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන් දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා ඉල්ලුම් කළ යුතු අතර දෙපාර්තමේන්තු ප්‍රධානියා අදාළ නිලධාරියා එම තනතුරට තෝරා ගන්නේ නම් ඔහු නිදහස් කරන බවට නිර්දේශ කළ යුතුය.
4. අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයැදුම්කරුවන් අතුරින් තෝරාගත් අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
5. ඉහත සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කිරීම සඳහා සහතිකපත්වල ඡායා පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.
6. අයැදුම්කරු තනතුරක් සඳහා අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලත් අයෙකු ලෙස සලකනු ලබන්නේ අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පෙර අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම් පමණි.
7. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස් මණ්ඩලයට පමණක් පත්කිරීමේ බලය ඇත.
8. බාහිරව බඳවා ගන්නා පුද්ගලයින් වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ ස්ථානගත කරනු ලැබේ. අභ්‍යන්තරව බඳවා ගන්නා පුද්ගලයින්ගේ වැටුප ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව තීරණය කරනු ලැබේ.

අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ ඥාතී නොවන නිර්දේශයන් දෙදෙනෙකුගේ විස්තර ඇතුළත් ජෛව දත්ත සහිත අයදුම්පත් 2025.05.08 දිනට හෝ ඊට පෙර "ලේකම්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, අංක 14, ආර් ඒ ද මෙල් මාවත, කොළඹ 04" යන ලිපිනයට යොමු කරන ලද ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. ඉල්ලුම් කරන ලද තනතුර අයදුම්පත අඩංගු ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ලිවිය/ටයිප් කළ යුතුය.

ලේකම්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
10.04.2025